# දැන්වීමයි

# හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී තනතුරට බඳවා ගැනීම

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී තනතුරට බඳවා ගැනීමට පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුර : හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

02. පත්වීමේ ස්වභාවය : වසර පහකට සීමාවේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

03. වැටුප් ක්‍රමය : සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

MM 1-1 - 2016: (රු. 53175-10x1375-15x1910-95575/=)

04. අවශ්‍ය සුදුසුකම් : ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කුමන විෂය ධාරාවකින් හෝ ලබාගත් ප්‍රථම උපාධිය.

සහ

උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර (03) ක පළපුරුද්දක් තිබිය යුතුය.

05. වයස් සීමාව : අවු. 25 ට නොඅඩු විය යුතු අතර, අවු. 50 ට නොවැඩි විය යුතුය.

06. වෙනත් : සෑම ඉල්ලුම්කරුවෙක්ම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

07. බඳවා ගැනීමේ ක්‍රමවේදය : පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම් වූ කුසලතා අනුව බඳවා ගනු ලැබේ.

08. සුදුසුකම් ලබන දිනය : සේවයට/ තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙස පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 4, 5 හා 6 යන වගන්තිවල සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

09. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය : අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සෑම ආකාරයකින්ම සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත් කළ යුතු අතර, 4 හා 5 යන වගන්ති වලින් දැක්වෙන සුදුසුකම් සනාථ කිරීම සඳහා නිසි පරිදි සහතික කරන ලද අධ්‍යාපන හා අනෙකුත් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පත්වීම් බලධාරියා වනුයේ හෝමියෝපති වෛද්‍ය සභාව වන අතර, එහි තීරණය අවසාන තීරණය වේ.

ඔබ විසින්ම සකස් කරන ලද ඉල්ලුම් පත්‍රයක්

**සභාපති, හෝමියෝපති වෛද්‍ය සභාව,**
**94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම.**
**යන ලිපිනයට 2022 ජනවාරි මස 03 වෙනි දින දහවල් 12.00 ට පෙර යොමු කළ යුතුය.**

**ඩී. එම්. අෂාන් තිලංක,**
**සභාපති,**
**හෝමියෝපති වෛද්‍ය සභාව.**